**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය - 2016**

**-----------------------------------------------------------------**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හා එහි පරිපාලිත සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 18 (3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (**ISSAI 1000 – 1810**) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය**

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය - කාර්යාංශය**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

**------------------------------**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුව, පාරිතෝෂික වගකීම සතු ආයෝජනයක් පවතී නම් අදාළ ආයෝජනය සම්බන්ධයෙන් සාධාරණ අගය ගැලපීමක් සිදුකර සත්‍ය ප්‍රතිලාභය හා අපේක්ෂිත ප්‍රතිලාභය අතර වෙනස, ආයුගණක තක්සේරුව මත ගණනය කරන ලද ලාභය හෝ පාඩුව ලෙස හඳුනාගත යුතු ය. එහෙත් කාර්යාංශය විසින් පාරිතෝෂික වගකීම සඳහා කරන ලද ආයෝජනයේ 2016 දෙසැම්බර් 31 දිනට වූ රු.151,637,722 ක වටිනාකමට අදාළ සාධාරණ අගය ගැලපීමක් සිදු කර නොතිබුණු අතර එම ආයෝජන වටිනාකම ආයුගණක තක්සේරුවේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**---------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම් විෂයයන් 02 ක පිළිවෙලින් රු.2,453,136 ක හා රු.**21,140,548** ක පැහැදිලි නොකල ශේෂ ඇතුළත්ව තිබූ නමුත් එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගමනිකයින්ගේ පැමිණිලි /ආරාවුල් සමතයකට පත්කිරීම සඳහා නියෝජිත ආයතන විසින්, සමාලෝචිත වර්ෂය අවසානයට කාර්යාංශයේ තැන්පත් කර තිබූ ශේෂය රු.10,120,447 ක් වූ අතර ඒ තුළ 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු.6,788,954 ක ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වන්දි ගෙවීම සඳහා කාර්යාංශයට ලැබී තිබූ රු.4,781,403 ක මුදලින් 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු.939,510 ක් විවිධ හේතූන් මත 2016 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ පාර්ශවයන්ට නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) විදේශ දූත මණ්ඩල සුභ සාධන අංශ විසින් 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව රැස්කර කාර්යාංශය වෙත ප්‍රේෂණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ලබා දී තිබූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තු රු.2,622,815,725 කින් රු.953,461,366 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් කාර්යාංශය වෙත ලැබී නොතිබුණි.

(ඈ) **2000** වර්ෂයේ සිට **2010** වර්ෂය දක්වා වූ කාලයට අදාළව විදේශ රැකියා නියෝජිත ආයතන 84 කින් අයකර ගත යුතු රු.658,250 ක සෙස් බදු 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණි.

(ඉ) 2013 වර්ෂය හා 2014 වර්ෂයට අදාළ සංවර්ධන නිලධාරීන්ගේ දුරකථන බිල්පත් නිරවුල් කිරීමට අදාළව රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.3,213,783 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගුවන් තොටුපල ඒකකය මගින් කාර්යාංශ ලියාපදිංචිය ලබාදීමේදී අයවිය යුතු සම්පූර්ණ ගාස්තුව නොගෙවූ විගමණිකයන්ගෙන් ලැබිය යුතු රු.602,759 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(උ) කාර්යාංශයට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන ඕමාන් තානාපති කාර්යාලය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් 2013 වර්ෂයේ සිට ලැබිය යුතු රු.52,270,080 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද අපොහොසත් වී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.37,172,298 ක් වූ විවිධ ණය හිමි ශේෂය තුළ 2012 වර්ෂයේ සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු.24,317,124 ක් වූ ශේෂ 2017 ජූනි 30 දින වන විටත් නිරවුල් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(එ) 2015 වර්ෂයේ දී අයකරගන්නා ලද කොරියන් වීසා තැන්පතු රු.730,200 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) කොරියන් ප්‍රවේශපත්‍ර ගාස්තු වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව අයකර ගෙන තිබූ රු.89,184,454 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් කොරියන් රැකියා අයදුම්කරුවන් වෙත නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) සේවක ණය සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවට අනුව, 2016 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිටි තිබූ වර්ෂයක කාලය ඉක්මවන ලද ආපදා සහ වාහන ණය ශේෂය රු.2,222,165 ක් වූ අතර එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | **(i)** මුදල් රෙගුලාසි 371 | අතුරු අග්‍රිම වශයෙන් ලබාගත් අත්තිකාරම්, නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකල යුතු වුවත් ඊට පටහැනිව 2003 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලබාදුන් රු.7,559,410 ක් වූ අග්‍රිම අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි. |
| | **(ii)** මුදල් රෙගුලාසි 571 | ආපසු ගෙවිය යුතු රු.1,875,084 ක් වූ ටෙන්ඩර් තැන්පතු ශේෂය තුළ වර්ෂ 05 ක් ඉක්ම වූ රු.578,680 ක තැන්පතු රජයේ ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | **(iii)** මුදල් රෙගුලාසි 757 (2) | 2014 වර්ෂයේ වත්කම් සත්‍යාපනයේ දී හඳුනාගන්නා ලද උපකරණ අයිතම් 2106 ක අස්ථානගතවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | කාර්යාංශය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කල යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2017 නොවැම්බර් 24 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ඈ) | **2014** නොවැම්බර් 22 දිනැති අංක **PRE/2015/43** දරන මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 **(i)** ඡේදය | චක්‍රලේඛයට පටහැනිව බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල මැතිවරණ කාල සීමාව තුළ රටවිරු සංවිධාන වැඩසටහන් සඳහා යොදවා ගැනීමට කුලී පදනම මත ලබාගත් වාහන වෙනුවෙන් **2016** වර්ෂයේ දී රු.2,858,641 ක් ගෙවා තිබුණි. |

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ **9.7** ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් කාර්යාංශ නිලධාරීන් සඳහා පැමිණීමේ දීමනා, මාසික ඉලක්ක සපුරා ගැනීමේ දීමනා, ගුවන් තොටුපල ඒකකයේ නිලධාරීන්ට කරන ලද ගෙවීම්, පැය 24 පුරා ක්‍රියාත්මක විගමණික තොරතුරු මැදිරියේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා විශේෂ දීමනා ගෙවීම් හා අවදානම් දීමනා ලෙස රු.64,491,839 ක විවිධ දීමනා ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ සහ කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.944,363,600 ක් සහ රු.942,355,085 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභ පිළිවෙලින් රු.884,713,213 ක් සහ රු.883,817,095 ක් වුයෙන් ඉකුත් වර්ෂය සමග සැසදීමේ දී සමාලෝචිත වර්ෂයේ සමූහයේ හා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.59,650,387 කින් සහ රු.58,537,990 කින් වර්ධනය වී තිබුණි. මෙහෙයුම් හා මූල්‍ය ආදායමේ රු.622,757,544 කින් වැඩිවීම හා ප්‍රචාරණ වියදමේ හා සුබසාධන අරමුදලේ වෙනත් වියදම් රු.44,714,891 කින් අඩුවීම ඉහත වර්ධනයට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ශුද්ධ ලාභයේ වර්ධනයක් සිදුවී තිබුණ ද එය 2015 වර්ෂයේදී සුළු වශයෙන් අඩුවීමක් සිදුවී තිබුණි. එහෙත් 2016 වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 57.5 ක වර්ධනයක් විය. තවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික රජයට ගෙවූ බදු හා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.1,252,718,830 ක් වූ කාර්යාංශයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,640,624,061 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර 2015 වර්ෂයට සාපේක්ෂව එය සියයට 50ක වර්ධනයක් විය.

**3.2 කාර්යාංශයට එරෙහිව හෝ කාර්යාංශය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන් විසින් කාර්යාංශයට එරෙහිව සමාලෝචිත වර්ෂයේ අවසානයට නඩු **13** ක් ගොනු කර තිබූ අතර කාර්යාංශය විසින් ඒ සඳහා රු.**73,766,962** ක් අසම්භාව්‍ය බැරකම් ලෙස හඳුනාගෙන තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශය වෙත කරනු ලැබූ පැමිණිලි සම්බන්ධයෙන් සිදුකල විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලැබී තිබූ පැමිණිලිවලින් 2,267 ක් 2016 ජනවාරි 01 දින වන විට නොවිසඳී තිබුණු අතර වර්ෂය අවසානය වන විට ඉන් 244 ක් තවදුරටත් නොවිසඳී තිබුණි.

(ii) 2016 වර්ෂය තුළ ලැබු පැමිණිලි 5,686 න් පැමිණිලි 2,320 ක් හෙවත් සියයට 41 ක් සඳහා පමණක් විසඳුම් ලබා දී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ පැමිණිලිකරු තවදුරටත් ක්‍රියාත්මකවීම අනවශ්‍ය ලෙස දැන්වීමෙන් හා පැමිණිලිකරුවන් විසින්ම ලිපි ගොනුව වසා දැමීමට තීරණය කර ඇති පැමිණිලි ප්‍රමාණය 1,911 ක් විය. ඒ අනුව විසඳීමකින් තොරව ලිපිගොනු වසා දැමීම හා පැමිණිලිකරු විසින් තවදුරටත් ක්‍රියාත්මකවීම අනවශ්‍ය ලෙස දැන්වීමෙන් වසා දැමීමට තීරණය කල පැමිණිලි 2,274 ක් විසඳු පැමිණිලි ලෙස වාර්තා කර තිබූ අතර එය විධිමත් නොවන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, එම පැමිණිලි සම්බන්ධයෙන් අධ්‍යනය කර සත්‍ය වශයෙන්ම තවදුරටත් ගැටළුවක් පවතින්නේද යන්න පරීක්ෂා කර බැලීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(iv) පැමිණිලි සඳහා ලබා දී තිබූ විසඳුමක් ලෙස " විගමණික සේවකයා ආපසු ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම " යන්න සඳහන්ව තිබුණ ද එලෙස ගෙන්වා ගත් විගමණිකයන් ගණන 2,016 ක් විය. ඒ අනුව වර්ෂයේ විසඳා ඇති පැමිණිලි 5,686 න් 2,016 ක්ම සේවකයා නැවත ලංකාවට ගෙන්වා ගැනීමෙන් පමණක් විසඳුම් ලබා දී තිබූ ඒවා වූ අතර එවැනි ගැටළු නැවත ඇති නොවීමට ස්ථිරසාර පිළියම් යෙදීම කෙරෙහි අවධානය යොමු කරන ක්‍රමවේදයක් ගොඩනැගීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්යාංශ පනතේ 30 වගන්තිය යටතේ බලපත්‍රයක් අලුත් කිරීමේ දී එහි 28 වගන්තියේ වූ විධි විධාන පිළිපැද ඇති බවට කාර්යාංශය සෑහීමකට පත්විය යුතු අතර පනතේ 31 වගන්තිය යටතේ එකී විධිවිධාන කිසිවක් කඩකර ඇත්නම් බලපත්‍රය අවලංගු කිරීමටද හැකි බව දක්වා තිබුණි. නමුත් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන 27 ක් සම්බන්ධයෙන් වසර දෙකක ලද පැමිණිලි හා විදේශගතවීම් පරීක්ෂාවේ දී නියෝජිත ආයතනවල පැමිණිලිවල වැඩිවීමක් හා වසර දෙකක විදේශගතවීම් අඩුවීමට වඩා අඩු ප්‍රතිශතයකින් පැමිණිලි ලැබීම් අඩු වී තිබුණු අතර සමහර අවස්ථාවලදි විදේශගතවීම් වැඩි වී තිබුණද ඊට වඩා වැඩි ප්‍රතිශතයකින් පැමිණිලිවල වැඩිවීමක් නිරීක්ෂණය විය. එමනිසා කාර්යාංශය උක්ත පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළේද යන්න විගණනයේ දී ගැටළුකාරී විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සහ කාර්යාංශයේ සහයෝගිතාවයෙන් විගමණික සේවකයන් සඳහා ක්‍රියාත්මක වූ නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ විගමණිකයන් 10,264 දෙනෙකු සඳහා සමෘද්ධි බැංකුව මගින් රු.මිලියන 2,998ක ණය මුදලක් ලබා දී තිබූ අතර මේ වන විට එම යෝජනා ක්‍රමය අකර්මන්‍ය වී තිබුණි. ඉන් සියයට 26 ක් වූ විගමණිකයින් 2,674 දෙනෙකු වෙත ලබා දී තිබූ රු.මිලියන 610.14 ක (සියයට 20ක) ණය ආපසු ගෙවීම පැහැර හැර තිබුණි. තවද විගමණිකයන් 1573 දෙනෙකු වෙත ණය ලබාදීමේ කොන්දේසිවලට පටහැනිව හා කිසිදු ඇපයක් තබා නොගෙන මුළු ණය ප්‍රමාණයෙන් සියයට 12 ක් හෙවත් රු.මිලියන 360.27 ක ණය ලබා දී තිබුණි. තවද, කාර්යාංශය විසින් උක්ත කාර්ය සඳහා සමෘද්ධි අධිකාරියේ තැන්පත් කරන ලද රු.මිලියන 100 ක තැන්පතු මුදලේ පොළියද 2014 වර්ෂයේ සිට ලැබී නොතිබුණි.

(ආ) විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අබුඩාබි කාර්යාලයේ 2014 ජූනි මාසයේ සිදු වී තිබූ රු.1,058,276 ක මූල්‍ය අක්‍රමිකතාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට 2014 ජූනි 17 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් යොමු කර වර්ෂ තුනකට වැඩි කාලයක් ගත වී තිබුණ ද එහි සැලකිය යුතු ප්‍රගතියක් විගණනයේ දී නිරීක්ෂණය නොවිණි. මේ සම්බන්ධයෙන් කාර්යාංශය විසින් විධිමත් ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි.

(ඇ) කාර්යාංශය විසින් අවස්ථා 101 කදී විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබූ රු.2,822,750 ක අත්තිකාරම් මුදලින් රු.1,762,741 ක්, එනම් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් භාවිතා කිරීමෙන් තොරව නැවත කාර්යාංශය වෙත පියවා තිබුණි. ඒ අනුව අත්තිකාරම් මුදල් නිසි කළමනාකාරීත්වයකින් යුතුව ලබා දී ඇති බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(ඈ) ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 95 ක් වූ සී/ස කහගොල්ල ඉංජිනේරු සේවා සමාගමකට අයත් ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත ලබා ගැනීම සඳහා කාර්යාංශය විසින් 2013 වර්ෂයේ රු.මිලියන 20 ක අත්තිකාරමක් සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ගෙවා තිබුණි. 2013 ජනවාරි 17 දිනැති අංක 10/2013 (**M**-01) දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව ගොඩනැගිලිවල හා ඉඩමේ නිරවුල් භුක්තිය භාරගන්නා ලෙස කාර්යාංශය වෙත දන්වා තිබුණද 2017 ඔක්තෝබර් වන විටත් ඉඩමේ නිරවුල් භුක්තිය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) කාර්යාංශය විසින් තංගල්ල හා කුරුණෑගල ඉඩම් සංවර්ධනය කිරීමේ කටයුතු වෙනුවෙන් රු.309,600,107 ක් වැය කර තිබුණු නමුත් 2017 ඔක්තෝබර් වන විටත් එම ඉඩම් කාර්යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිටිපන මාහේනවත්තේ පිහිටි අක්කර 05 ක ඉඩම් ප්‍රමාණයක් අවු.50 ක කාලයකට බදු පදනම මත ලබා දීමට 2010 නොවැම්බර් 03 දින තීරණය කර තිබුණි. 2010 ජනවාරි 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර තක්සේරු කමිටුව විසින් රු.මිලියන 52 කට තක්සේරු කර එම මුදලින් සියයට 50 ක් වූ රු.මිලියන 26 ක් කාර්යාංශය විසින් 2010 පෙබරවාරි 26 දින ගෙවා ඉඩමෙහි භෞතික අයිතිය කාර්යාංශය වෙත පවරාගෙන තිබුණි. මෙම ඉඩම සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරු ලවා තක්සේරුවක් ලබා ගැනීමෙන් තොරව සියයට 50 ක ගෙවීම් සිදුකර තිබුණු අතර 2017 දෙසැම්බර් 04 දින දක්වාම එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට හා අදාළ කාර්යය සඳහා යෙදවීමට ක්‍රියාකර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ පරමාර්ථ අතරට ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්ති අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම ඇතුළත්ව තිබූ නමුත් 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාර්යාංශය වෙත අනුමත කිරීම සඳහා ලැබී තිබූ රැකියා ඇණවුම් ප්‍රමාණයෙන් සියයට 50 ක් සඳහාවත් ශ්‍රමිකයන් සැපයීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) 2008 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ විදේශ රැකියා ඇණවුම්වල පහල යාම සියයට 40 ක් වූ අතර 2013 වර්ෂයේදී එය සියයට 21 කින් වර්ධනය වී තිබුණි. එහෙත් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එය ක්‍රමයෙන් පහළ ගොස් තිබූ අතර එය 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 34 ක් විය. ඒ අනුව, 2008 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ රැකියා වෙළඳපල අහිමිවීම සියයට 73 ක් විය. 2008 වර්ෂයේ දී සියයට 16 ක් වූ ශ්‍රමික සම්පාදනය 2016 වර්ෂය වන විට සියයට 32 ක් දක්වා වර්ධනය වීමක් පෙන්නුම් කළද, එය කාර්යාංශයේ කාර්ය සාධනයේ උන්නතියක් නිසා සිදුවූවක් නොව විදේශ රැකියා වෙළඳපලේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා පැවති ඉල්ලුම හීන වීම නිසා බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) පුහුණු ශ්‍රමිකයින් වැඩි වශයෙන් විදේශ රැකියා වෙළඳපල වෙත යොමු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණියන් දැනුවත් කිරීම සඳහා රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ආරම්භ කරන ලද නියමු ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත එම දිස්ත්‍රික්කවලින් සම්බන්ධීකරණ නිලධාරීන් පිළිවෙලින් 06 දෙනෙකු සහ 04 දෙනෙකු බඳවාගෙන තිබුණි. 2016 වර්ෂයේදී රු.30,000 ක දීමනාවක් මත බඳවාගෙන තිබූ එම නිලධාරීන් 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඡේද අංක 07 හි නියමයන්ට පටහැනිව බඳවා ගෙන තිබූ අතර ඒ සඳහා 2016 දෙසැම්බර් 31 දින දක්වා රු.2,344,000 ක වියදමක් කාර්යාංශය විසින් දරා තිබුණි. එහෙත් එම නියමු ව්‍යාපෘතියේ කාල සීමාව අවසන්ව තිබුණද ඊට අදාළ ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ කිසිදු පසු විපරමක් කාර්යාංශය විසින් සිදු කර නොතිබුණි.

(ඈ) අමාත්‍යවරිය විසින් සිංගප්පූරුවේ දී ලබාගත් වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් වැය වූ සිංගප්පූරු ඩොලර් 989.25 ක මුදල (ආසන්න වශයෙන් රු.102,993 ක්) කාර්යාංශයේ සුභ සාධන අරමුදලින් දැරිය නොහැකි වුවද එම මුදල වෙනත් නිලධාරියෙකු නමින් අමාත්‍යවරිය වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි.

## 4.4 නිශ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අපහරණය කිරීමට නියමිතව ඇති කාර්යාංශයේ වාහන 27 ක් 2015 ජුලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසා දැමූ පුහුණු මධ්‍යස්ථානවල තිබූ භාණ්ඩ අයිතම් 07 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

## 4.5 ආර්ථික නොවන ගනුදෙනු

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා පිටව යන හා සේවා නියුක්තියෙන් පසු පෙරලා රටට පැමිණෙන ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමට කාර්යාංශය කටයුතු කර තිබුණි. ඒ අනුව, 2016 ජනවාරි 08 සිට 14 දක්වා වූ කාල සීමාව තුළ දී ලියාපදිංචිය සිදුකිරීම සඳහා ක්‍රියාත්මක කල ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් කාර්යාංශය රු.8,274,964 ක් වැය කර තිබුණි.

කෙසේ වුවද, එම කාල සීමාව තුළදී 2014 හා 2015 වර්ෂවල විදේශගත වූ ශ්‍රමිකයින් 563,768 ගෙන් සියයට 25 ක තරම්වත් වූ ප්‍රමාණයක් උක්ත දත්ත බැංකුවේ ලියාපදිංචි වීම සිදු වී නොතිබුණි. ඒ අනුව ඒ සඳහා දරන ලද වියදම ඵලදායී නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

## 4.6 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේඛීය අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබූ විදේශ ගමන් සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද රු.463,481 ක් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු කර තිබීම හේතුවෙන් අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි.

(ආ) කාර්යාංශ පනතේ 53(3) වගන්තියෙන් බැහැරව කාර්යාංශය විසින් නම් කරනු ලැබූ විදේශ රැකියා නියෝජිත ආයතනයන් හරහා ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට ඉඩ සලසමින් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර තිබුණි. ඒ හේතුවෙන් ලියාපදිංචි ගාස්තු ලෙස කාර්යාංශය විසින් 2015 සහ 2016 වර්ෂවල රැස්කර ගන්නා ලද ආදායමින් සියයට 70 ක් එනම් පිළිවෙලින් රු.31,612,000 ක් හා රු.91,623,000 ක් ලෙස එකතුව රු.123,235,000 ක් එසේ නම් කරනු ලැබූ පෞද්ගලික නියෝජිත ආයතනවලට ගෙවීමට කටයුතු කර තිබීමෙන් කාර්යාංශයට එම ආදායම අහිමි වී තිබුණි.

(ඇ) කොරියානු රැකියාලාභීන්ගේ වෛද්‍ය පරීක්ෂණයන් සිදු කිරීම සඳහා අවශ්‍ය වන පරිපාලන සේවාවන් ලබාදීමේ කටයුතු වෙනුවෙන් අදාළ මාසයේ වෛද්‍ය ගාස්තු ආදායමින් සියයට 25 ක් කාර්යාංශය පරිපාලිත සමාගම වෙත ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ සමාගම රු.9,507,988 ක ආදායමක් උපයාගෙන තිබූ නමුත් අදාළ සියලු පරිපාලන කටයුතු කාර්යාංශයේ බඳවා ගැනීම් අංශය විසින් සිදු කර තිබුණි.

**4.7 වෙනත් ආයතන වෙත ලබා දුන් කාර්යාංශයේ සම්පත්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය තුළ කාර්යාංශය විසින් රේගීය අමාත්‍යාංශය වෙත නිලධාරීන් 07 දෙනෙකු හා පරිපාලිත සමාගම වෙත නිලධාරීන් 03 දෙනෙකු සේවය සඳහා යොදවා තිබූ අතර වැටුප් හා දීමනා ලෙස රු.5,308,240 ක් කාර්යාංශය විසින් වැය කර තිබුණි. මීට අමතරව සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය වෙත නිලධාරීන් දෙදෙනෙකු නිදහස් කර තිබුණි.

(ආ) කාර්යාංශය විසින් 2016 වර්ෂය තුළ විදේශ රැකියා අමාත්‍යාංශයේ කටයුතු සඳහා වාහන 04 ක් වෙන් කර තිබූ අතර ඒ වෙනුවෙන් රු.3,292,242 ක වැයකර තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1248 ක් වූ අතර මාණ්ඩලික ශ්‍රේණියේ, මාණ්ඩලික නොවන ශ්‍රේණියේ සහ වෙනත් යන කාණ්ඩවල පිළිවෙලින් නිලධාරීන් 81, 38 හා 11 ක ඌනතාවයක් වූ අතර සුළු සේවකයින් 46 ක අතිරික්තයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අනුමත නොවූ තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 44 දෙනෙකු වෙනුවෙන් රු.17,892,771 ක වැටුප් ගෙවා තිබුණි.

(ඇ) විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දූත මණ්ඩල සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කර ඇති තනතුරුවලට අනුමත බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව කාර්යාංශය විසින් සකසාගත් බඳවා ගැනීමේ ක්‍රම වේදයකට බඳවා ගැනීම් සිදු කර තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

---

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | **(i)** | කාර්යාංශයට ලැබිය යුතු හා කාර්යාංශය විසින් ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| | | **(ii)** | විදේශ දූත මණ්ඩල මගින් උපයා ගනු ලබන ආදායම් රැස්කර ගැනීම හා ඵලදායී ලෙස විගමණික ශ්‍රමිකයන්ට එම මුදල් සේවාවන් සැපයීම සඳහා ප්‍රයෝජනයට නොගැනීම. |
| (ආ) | මෙහෙයුම් පාලනය | **(i)** | ඉඩම් මිලදී ගැනීමේ දී විධිමත් අයිතිය පිළිබඳ තහවුරු කර ගැනීමකින් තොරව මිලදී ගැනීමට කටයුතු කිරීම. |
| | | **(ii)** | විදේශ රැකියා නියෝජිත ආයතනවල කටයුතු ක්‍රමවත් කිරීම හා පාලනය කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | මානව සම්පත් පාලනය | | කාර්යාංශය සතු භෞතික හා මානව සම්පත් පාලනය හා උපයෝජනය විධිමත්ව සිදු නොවීම. |